සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ලබා දී ඇති ප්‍රශ්නවලට ගැළපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) දෙවියන් වහන්සේගේ ස්වරූපය හා සමානාත්මතාවය අනුව මිනිසා මවන ලද බව සඳහන් වන ග්‍රන්ථය වන්නේ,
(i) එළිදරව්ව ය (ii) උත්පත්තිය (iii) නික්මයාම ය (iv) ලූක් ය

(02) අයකැමියෙකු ලෙස බදු පොලේ සිටියදී කැඳවීම ලැබූ ගෝලයෙකු වන්නේ,
(i) පේදුරු තුමාය (ii) ලූක් ය (iii) යොහාන්ය (iv) මතෙව්ය

(03) ''මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි'' යනුවෙන් යේසුස් වහන්සේ පැවසුවේ කවුරුන් පිළිබඳවද?
(i) සිමොන් (ii) සාකෙවුස් (iii) පේදුරු (iv) යොහන්

(04) ගලීල මුහුද සඳහා යෙදෙන තවත් නමක් වන්නේ,
(i) රතු මුහුද (ii) මළ මුහුද (iii) මධ්‍යධරණී මුහුද (iv) තිබේරියස් මුහුද

(05) යේසුස් වහන්සේ ශ්‍රාවකයන් දොලොස් දෙනා පිටත්කර හරිමින් ඔවුන්ට පැවසීමට නියම කළ ප්‍රධාන පණිවිඩය වන්නේ,
(i) යේසුස් වහන්සේ මොහොතකින් වඩින බවය
(ii) ස්වර්ග රාජ්‍ය ළංවී ඇති බවය
(iii) පසුතැවිලි විය යුතු බවය
(iv) යේසුස් වහන්සේ පිළිගැනීමට උත්සවයක් සූදානම් කළ යුතු බවය.

(06) යේසුස් වහන්සේගේ දූත සමයේ පලස්තීනය යටත් කරගෙන සිටි අධිරාජ්‍යයා වනුයේ,
(i) මිසර අධිරාජ්‍යයා (ii) අසිරියානු අධිරාජ්‍යයා (iii) රෝම අධිරාජ්‍යයා (iv) ග්‍රීක අධිරාජ්‍යයා

(07) ආබ්‍රහම්ගේ පෙර නම වූ ''ආබ්‍රම්'' යන්නෙහි අර්ථය වනුයේ,
(i) ජාතීන්ගේ පියා (ii) උතුම් පියා (iii) විශ්වයේ පියා (iv) සැමගේ පියා

(08) ''ස්වාමීනි ඔබ කැමති සේක් නම් මා පවිත්‍ර කරන්න ඔබට පුළුවන'' යැයි පැවසූ රෝගියා වූයේ,
(i) අංශභාග රෝගියාය (ii) යායිරස්ගේ දියණියයි
(iii) ලාදුරු රෝගියාය (iv) ගොළු බිහිරි රෝගියාය

(09) යේසුස් වහන්සේ සිය ප්‍රථම දේශනය සිදුකළේ,
(i) ගලීල මුහුද ළඟය (ii) නාසරෙත් ධර්මශාලාවේදීය
(iii) පාළුකරයේදීය (iv) තැනිතලාවේදීය

(10) පැරණි ගිවිසුමේ අඩංගු පොත් ගණන වනුයේ,
(i) 66 (ii) 27 (iii) 39 (iv) 40

(11) දෙබෝරා වනාහි
(i) ශ්‍රාවිකාවකි (ii) පූජකවරියකි (iii) ධර්මදූත සේවිකාවකි (iv) විනිශ්වයකාරවරියකි

(12) ඊශ්‍රායෙල් සෙනගට කාන්තාර ගමනේදී දිවා කාලයේ මඟ පෙන්වූයේ,

(i) වළා ටැබක්ය (ii) ගිනි ටැබක්ය (iii) විශාල ආලෝකයක්ය (iv) ගිනි සහ වළ ටැඩක්ය

(13) කිසිදු ප්‍රතිඋපකාරයක් බලාපොරොත්තු නොවී අන් අයගේ අවශ්‍යතාවයන් සැපිරීමට ඉදිරිපත් වීම

(i) සාමයයි (ii) ප්‍රීතියයි (iii) ඉවසීමයි (iv) ප්‍රේමයයි

(14) මච්කුස පිළිසිඳ ගැනීමටත් පෙර දිව්‍යසිවර සේවයට කැඳවනු ලැබුවේ,

(i) යෙසායා ය. (ii) එසකියෙල් ය. (iii) ජෙරමියා ය. (iv) නෙහෙමියා ය.

(15) මැලේරියා රෝගීන් අතර මහඟු සේවයක් ඉටු කළ විදේශීය ජාතික කාන්තාව වන්නේ,

(i) ජොයිස්ද සිල්වා ය. (ii) ඒඩා ප්‍රනාන්දු ය. (iii) තෙරේසා මච්තුමිය ය. (iv) ඉව්ලින්කානි ය.

(16) දේව කැමැත්ත ඉටු කිරීම උදෙසා අප කළ යුතු වන්නේ,

(i) ප්‍රශංසා මෙහෙයන්ට සහභාගී වීම

(ii) සෑම ඉරිදාම පල්ලි යාම

(iii) දේව ගුණාංග ජීවිතයෙන් පෙන්වීම

(iv) අප අවට පරිසරය පිරිසිදු කිරීම

(17) යේසුස් වහන්සේ මෙලොවට වැඩීමේ මූලික පරමාර්ථය වූයේ,

(i) ගැළවීම උරුම කර දීමය. (ii) මරණය ලබා දීම

(iii) පාපය උරුම කර දීම (iv) තෑගි ලබා දීම

(18) ජෙරුසලම් පවුර ගොඩනැගීමට මූලිකව කටයුතු කළේ,

(i) එළියාය. (ii) නෙහෙමියාය. (iii) එලිෂාය. (iv) හොෂියාය.

(19) ශුද්ධාත්ම දීමනා අපට ලැබී ඇත්තේ,

(i) එකිනෙකා අතර බලය පෙන්වීමටය.

(ii) අපගේ පෞද්ගලික ජීවිතය ශක්තිමත් කර ගැනීමටය.

(iii) සභාවේ භෞතික සම්පත් දියුණුවට අතහිත දීමටය.

(iv) එකිනෙකා දිරිගන්වමින් කිතුනු සභාව ශක්තිමත් කිරීමටය.

(20) යේසුස් වහන්සේ සීමොන් පේදුරුට භාරදුන් වගකීම වන්නේ,

(i) මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න.

(ii) මාගේ බැටළුවන්ට ආදරය කරන්න.

(iii) මාගේ බැටළුවන් නොමඟ නොයවන්න.

(iv) මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න.

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. කෙටි පිළිතුරු සපයන්න.**

(01) (i) දේව මැවිල්ල සුරකීමට ඔබට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න.

(ii) යුදෙව් සමාජය විසින් කොන්කරන ලද ජන කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(iii) යේසුස් වහන්සේගේ මෙහෙවරට කැපවූ මෑත කාලීන ධර්මදූතිකාවන් දෙදෙනෙකු නම් කරන්න.

(iv) යේසුස් වහන්සේගේ ගෝලයන් වූ සෙබදීගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(v) ඊසාක් හා රෙබෙකාගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

(vi) පංච පුස්තකයේ ප්‍රධාන කතුවරයාණන් නම් කරන්න.

(vii) යේසුස් වහන්සේ මරණය අභිබවා කළ ප්‍රාතිහාර්ය දෙකක් ලියන්න.

(viii) කිතුනු දරුවෙකු වන ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න.

(ලකුණු 2 × 8 = 16)

(02) (i) යේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳවනු ලැබූයේ කොහේදි ද?

(ii) මුල් ගෝලයන් තිදෙනෙකු නම් කරන්න.

(iii) දේව දරුවකු වන ඔබට දේව කැඳවීමක් ලැබුණොත් ඔබ ක්‍රියාකරන ආකාර තුනක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(03) (i) ශුද්ධ බයිබලයේ මුල් පොත් පහ හඳුන්වන නම් දෙකක් ලියන්න.

(ii) දස පනතෙහි මුල් පනත් තුන ලියන්න.

(iii) සාරධර්ම සහිත සමාජයක් ගොඩනැගීමට දසපනතින් ලබා ගන්නා මඟ පෙන්වීම් තුනක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(04) (i) ආදී පියවරු යනු කවුදැයි හඳුන්වන්න.

(ii) බයිබලයේ සඳහන් ආදී පියවරු තිදෙනෙක් නම් කරන්න.

(iii) කිතුනු දරුවෙකු ලෙස දේව මෙහෙවරෙහි යෙදීමට අවශ්‍ය මඟපෙන්වීම ඉල්ලා කරනු ලබන යැදුමක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(05) (i) ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න.

(ii) ඔබ ලබා ඇති දේව දීමනා දේව ගෞරවය සඳහා යොදා ගන්නා ආකාර තුනක් ලියන්න.

(iii) ඔබ පවුලේ අයෙකු රෝගී වූ විට කරන යැදුමක් ලියන්න. (ලකුණු 2+3+6 = 11)

(06) (i) දෙවියන් වහන්සේ මිනිසා නිර්මාණය සඳහා ගනු ලැබුවේ මොනවාද? ජීවය ලැබුවේ කෙසේද?

(ii) දේව මැවිල්ල තුළ මිනිසාට ලැබී ඇති අසමසම තත්වය කුමක්ද?

(iii) ඔබගේ මිතුරා හෝ මිතුරිය වරදට පෙළඹෙන අවස්ථා දෙකක් ලියා ඉන් මිදීමට ලබා දෙන උපදෙස් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)